සියලු ම හිමිකම් ඇවිරිණි.

Ananda College, Colombo 10

ආනන්ද විද්‍යාලය - කොළඹ 10

08 S I

අවසාන වාර පරීක්ෂණය - 2022 ඔක්තෝබර්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

කෘෂි විද්‍යාව I

Agriculture I

13 ශ්‍රේණිය

පැය 02 යි.

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

Ananda College Maths Section Exam Management Unit

01. සූර්ය විකිරණමානය ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන්නේ,
    (1) ආලෝකයේ ගුණාත්මක භාවය මැනීමටයි.
    (2) ආලෝක තීව්‍රතාවය මැනීමටයි.
    (3) දිවා දිග කාල සීමාව මැනීමටයි.
    (4) ආලෝකයේ තරංග ආයාමය මැනීමටයි.
    (5) වළාකුළුවල උස මැනීම

02. ශාකවලින් පිටවන ජල ප්‍රමාණයෙන් වැඩිපුර ප්‍රමාණයක් පිට වනුයේ,
    (1) වා සිදුරු මගිනි. (2) උච්චර්මය මගිනි. (3) පූටිකා මගිනි.
    (4) වා සිදුරු හා උච්චර්මය මගිනි. (5) බිංදුදය මගිනි.

03. උත්ස්වේදන සීඝ්‍රතාවය පාලනය කිරීමට යොදාගන්නා කෘෂිකාර්මික උපක්‍රමයක් වනුයේ,
    (1) වර්ධක හෝර්මෝන භාවිතයයි. (2) සෙවණේ ඇති අතු කප්පාදු කිරීමයි.
    (3) ශාකවලට සෙවණ ලබා දීමයි. (4) පැළ රෝපණයේදී පත්‍ර සම්පූර්ණයෙන් කපා දැමීමයි.
    (5) මුල් කප්පාදු කිරීමයි.

04. පසෙහි මැටි ඛනිජ (clay minerals) ඇති වන්නේ,
    (1) හයිඩ්‍රජන් හා ඔක්සිජන් මගිනි. (2) ඇලුමිනියම් හා සිලිකන් මගිනි.
    (3) කැල්සියම් හා මැග්නීසියම් මගිනි. (4) ඔක්සිජන් හා කැල්සියම් මගිනි.
    (5) සෝඩියම් හා පොටෑසියම් මගිනි.

05. සමෝධානිත පළිබෝධ කළමනාකරණය (IPM) පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය වනුයේ,
    (1) ජෛව පාලනයේ උපාය මාර්ග මූලික කරගත් ක්‍රියාවලියකි.
    (2) පළිබෝධ නාශක භාවිතා නොකරන පළිබෝධ පාලන ක්‍රමයකි.
    (3) භාවිත කළ හැකි සියලු පළිබෝධ පාලන උපාය මාර්ග භාවිත කරන පද්ධති පිවිසුමකි.
    (4) වගා භූමියට පළිබෝධ පැමිණීම වැළැක්වීමට යොදාගන්නා උපාය මාර්ගයකි.
    (5) පළිබෝධ පාලනයට වඩාත් උචිත එක් උපායමාර්ගයක් යොදාගන්නා ක්‍රමයකි.

06. එළදෙනකගේ කිරි මුදාහැරීම සඳහා හේතුවන හෝර්මෝනය වනුයේ,
    (1) ප්‍රොලැක්ටින් ය. (2) ඊස්ට්‍රජන්ය. (3) රිලැක්සින් ය.
    (4) ප්‍රොජෙස්ටරොන් ය. (5) ඔක්සිටොසින් ය.

07. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන අංශ පනත් වනුයේ,
    (1) කුඹුරු පනත හා ගොවිජන සංවර්ධන පනතයි.
    (2) කෘෂි රක්ෂණ පනත හා ජාතික පාරිසරික පනතයි.
    (3) වාරිමාර්ග ආඥා පනත හා කුඹුරු පනතයි.
    (4) ගොවිජන සේවා පනත හා ඉඩම් ප්‍රතිසංස්කරණ පනතයි.
    (5) පාංශු සංරක්ෂණ පනත හා පැළෑටි සංරක්ෂණ පනතයි

22 A/L අපි [papers group]

08. කෘමියෙකුගේ එක්තරා වර්ධන අවධියක් පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

'සම්පූර්ණ රූපාන්තරණ ආකෘතිය අනුගමනය කරයි. තටු ඇතිවන බවට සලකුණක් මතුපිටින් දක්නට නොලැබේ. ක්ෂීණ වූ ස්පර්ශක ඇත.'

ඉහත විස්තර කරන වර්ධන අවස්ථාව ඇතුලත් කෘමි ගෝත්‍රයක් වනුයේ,

(1) හෙමිප්ටෙරාය (2) ඩිප්ටෙරාය (3) කෝලියෝප්ටෙරාය
(4) ලෙපිඩොප්ටෙරාය (5) හයිමොනොප්ටෙරාය

09. පොස්පරස් චලතාව වැඩි කරන ජෛව පොහොර නිපදවීමට භාවිතා කරන ක්ෂුද්‍ර ජීවියෙකුට උදාහරණයකි
(1) *Pseudomonas* (2) *Aspergillus* (3) *Penicillium*
(4) *Rhizobium* (5) *Arbuscular Mycorrhizal fungi*

10. බෝග ජල අවශ්‍යතාව ප්‍රධාන වශයෙන් රඳා පවතින්නේ,
(1) බෝග වර්ගය, වාරි කාලාන්තරය හා භූ විෂමතාවය මතය.
(2) දේශගුණය, පස් ආකාරය හා බෝග වර්ගය මතය.
(3) බෝගයේ ආයු කාලය, දිවා දිග හා වාරි කාලාන්තරය මතය.
(4) දේශගුණය, භූ විෂමතාව හා සුළඟේ වේගය මතය.
(5) පස් ආකාරය, බෝගයේ ආයු කාලය හා භූමියේ බෑවුම මතය.

11. කෘෂි රසායන ඉසීමට භාවිත කරන අත් ඉසින යන්ත්‍රය (hand sprayer) සමන්විත වන්නේ,
(1) පීඩන ටැංකියක් පමණි. (2) මිශ්‍රණ ටැංකියක් පමණි.
(3) දියර ටැංකියක් පමණි. (4) දියර ටැංකියක් හා පීඩන ටැංකියක් පමණි.
(5) පීඩන ටැංකියක් හා මිශ්‍රණ ටැංකියකිනි.

12. කොළ එළවළු හා පලතුරු අස්වනු නෙළීමට වඩාත් සුදුසු කාලය වනුයේ,
(1) පිනි හිඳුනු පසු උදය කාලයයි. (2) හිරු බැස ගියපසු සන්ධ්‍යා කාලයයි.
(3) හිරු නැගීමට පෙර හිමිදිරි පාන්දර කාලයයි. (4) හිරු මුදුන්වන මධ්‍යහන කාලයයි.
(5) මධ්‍යහනත් සන්ධ්‍යා කාලයත් අතරයි.

13. සයිලේජ්වල කටුක අප්‍රියජනක සුවඳක් ඇතිවීමට හේතුවන වාෂ්පශීලී අම්ලය වනුයේ,
(1) ඇසිටික් අම්ලයයි. (2) ටාටරික් අම්ලයයි. (3) ලැක්ටික් අම්ලයයි.
(4) බියුට්‍රික් අම්ලයයි. (5) ප්‍රොපියොනික් අම්ලයයි.

14. අඹ, වී සහ වට්ටක්කා යන බෝග සඳහා බීජ තවාන් දැමීමට වඩාත් සුදුසු තවාන් වර්ගය වනුයේ,
(1) වැලි, ඩැපොග් හා කුට්ටි තවාන් ය. (2) සුසංහිත, කුට්ටි හා වැලි තවාන් ය.
(3) ස්පොන්ජ්, වැලි හා තැටි තවාන් ය. (4) වැලි, ඩැපොග් හා පාත්ති තවාන් ය.
(5) තැටි, ස්පොන්ජ්, හා කුට්ටි තවාන් ය.

15. පොල් සඳහා බද්ධ පැළ නොමැති වීමට ප්‍රධාන හේතුව වනුයේ,
(1) බද්ධ අසංගතිය සිදුවන බැවිනි.
(2) කඳේ නිම් සනාල කලාප විසිරී තිබෙන බැවිනි.
(3) බීජ පැළ ලබා ගැනීමට නොහැකි බැවිනි.
(4) ශාකය ඵල දැරීම සඳහා වැඩි කාලයක් ගත වන බැවිනි.
(5) ශාකයේ අතු බෙදීමක් සිදු නොවන බැවිනි.

16. පසක කෙතරම් හොඳින් ව්‍යුහය සංවර්ධනය වුවත් එම කැටිති දුර්වල විට පහසුවෙන් බිඳී යාම සිදුවේ. පාංශු කැටිතිවල ස්ථාවර බව දියුණු කිරීමට නම්,
(1) පස පෙරලීම මගින් පාංශු දෘශ්‍ය ඝනත්වය වැඩි කළ යුතු ය.
(2) පස් අංශුන් අතර ආකර්ෂණය වීම වැඩි කිරීමට පසේ Na^{+} අයන ප්‍රමාණය ඉහළ නැංවිය යුතුය.
(3) පසේ කැටිති කාබනික ද්‍රව්‍ය වියෝජනයෙන් ලැබෙන සංයෝග මගින් ස්ථාවර කළ යුතුය.
(4) පාංශු හුවමාරු සංකීර්ණයේ පවතින Na^{+} අයන විස්ථාපනය කර Al^{3+} අයන ඒ වෙනුවට ආදේශ කළ යුතුය.
(5) පසේ මහා අවකාශ හා ක්ෂුද්‍ර අවකාශ අතර අනුපාතය වැඩි කළ යුතුය.

Ananda College Maths Section Exam Management Unit

22 A/L අපි [papers group]

22 A/L අපි [papers group]

17. බිම් සැකසීමෙන් පසු පසේ ජල සන්නායකතාවය වැඩි වනුයේ,
    (1) පසේ දෘශ්‍ය ඝනත්වය වැඩිවීම මගිනි. (2) පසේ සත්‍ය ඝනත්වය අඩුවීම මගිනි.
    (3) පසේ සච්ඡිද්‍රතාවය වැඩිවීම මගිනි. (4) පසේ සුසංගික බව වැඩිවීම මගිනි.
    (5) පසේ අහඹු රළු බව අඩුවීම මගිනි.

18. දර්ශීය පාංශු පැතිකඩක් නිරීක්ෂණය කිරීමට වඩාත් සුදුසු වන්නේ
    (1) අධික වර්ෂාපතනයක් ඇති තෙත් කලාපයේ පසක් ය.
    (2) බෝග වගාවන් සිදු නොකරන ශුෂ්ක ප්‍රදේශවල පසක් ය.
    (3) උස් කඳු ආශ්‍රිත බෑවුම් සහිත පසක් ය.
    (4) ස්වභාවික වනාන්තරයක වූ පසක් ය.
    (5) ඒක වාර්ෂික බෝග වගා කර ඇති කෘෂිකාර්මික භූමියක පසක් ය.

19. බෝගයක ජල අවශ්‍යතාවය වැඩිම වනුයේ,
    (1) පුෂ්පීකරණ අවධියේ ය. (2) පරිණත වීමේ අවධියේ ය
    (3) බීජ පැළ අවධියේ ය. (4) වර්ධක අවධියේ ය.
    (5) ඵල මේරීමේ අවධියේ ය.

20. සුප්ත බීජවල ජීව්‍යතාව නිර්ණය කළ හැකි වනුයේ,
    (1) රැග්ඩොල් ක්‍රමයෙනි. (2) ටෙට්‍රාසෝලියම් පරීක්ෂාවෙනි.
    (3) හබරල පිති ක්‍රමයෙනි. (4) පෙට්‍රිදීසි ක්‍රමයෙනි.
    (5) තවාන් පෙට්ටි ක්‍රමයෙනි.

21. නව ශාක ප්‍රභේද නිපදවීම සඳහා සුදුසු වනුයේ,
    (1) වරණය හා අභිජනනයයි. (2) වරණය හා හඳුන්වාදීමයි.
    (3) විකෘති අභිජනනයයි. (4) පටක රෝපණ තාක්ෂණයයි.
    (5) ක්ෂුද්‍ර ප්‍රචාරණයයි.

22. ගවයින්ට වැළඳෙන පරිවෘත්තික රෝගයකට උදාහරණයක් වනුයේ,
    (1) බඩ පිපුමයි (2) කිණිතුළු උණයි. (3) ඇන්ත්‍රැක්ස් යි.
    (4) කිරි උණයි. (5) ඉන්ෆ්ලුවන්සා යි.

23. යම් භාණ්ඩයක් සඳහා ඇති ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීම සිදුවිය හැකි වනුයේ,
    (1) අනුපූරක භාණ්ඩයක මිල ඉහළයාම නිසාය.
    (2) එම භාණ්ඩයේ මිල පහළ වැටීම නිසාය.
    (3) ආදායම ඉහළ නැගීම නිසාය.
    (4) නිෂ්පාදන පිරිවැය ඉහළ නැගීම නිසාය.
    (5) කිට්ටු ආදේශක භාණ්ඩයක මිල පහළ වැටීම නිසා ය.

24. කුකුළන් 100 දෙනෙකුගේ රංචුවකට 345 kg ක ආහාර ප්‍රමාණයක් ලබාදුන් විට ඔවුන් සියල්ලගේ සජීවී බර වර්ධනය 199 kg ක් විය. මෙම කුකුළු රංචුවේ ආහාර පරිවර්තන අනුපාතය වනුයේ,
    (1) 0.58 කි. (2) 0.65 කි. (3) 1.67 කි.
    (4) 1.73 කි. (5) 1.99 කි.

25. සියලුම ශාකවලට අත්‍යවශ්‍ය වන මහා මූලද්‍රව්‍යයක් වනුයේ,
    (1) Mg හා Ca ය. (2) C හා Zn ය. (3) Co හා Ca ය.
    (4) Mo හා Mg ය. (5) Fe හා Mg ය.

26. ලීබිග්ගේ අවමතා නියමයට අනුව
    (1) බෝගයක වර්ධනය එයට උපරිම වශයෙන් ලැබෙන සාධකය මත තීරණය වේ.
    (2) බෝගයකට පළිබෝධ හානි නොමැති විට බෝගයේ අස්වැන්න වැඩි වීම සිදුවේ.
    (3) බෝගයක අස්වැන්න වැඩිවීම කෙරෙහි පාංශු සාධකවල බලපෑම අවම ය.
    (4) යොදන පොහොර ප්‍රමාණය අධික ලෙස ඉහළ දැමූ විට ශාකය සුබෝපභෝගී ලෙස පෝෂක ලබාගනී.
    (5) බෝගයක අස්වැන්න එයට අවම වශයෙන් ලැබෙන සාධකය මත තීරණය වේ.

27. කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන් හට ඇතිවන මානසික ගැටලුවකි.
    (1) ක්ෂය රෝගය (2) මී උණ (3) ආතතිය
    (4) පපුවේ වේදනාව (5) මස්පිඬු වේදනාව

Ananda College Maths Section Exam Management Unit

28. පහත දක්වා ඇති රූපයේ දැක්වෙන සංකේතය හා භාවිතා කරනු ලබන පරිරක්ෂණ ක්‍රමය වනුයේ,
   (1) ජීවාණුහරණයයි. (2) සුද්‍රිකරණයයි.
   (3) ශීත කිරීමයි. (4) ටින්බරීකරණයයි.
   (5) ප්‍රවිකිරණයයි.

29. සංරක්ෂණ ගොවිතැනේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ,
   (1) සෞඛ්‍යය, පස හා පරිසර විද්‍යා මූලධර්මවලට අනුව පරිසරය සංරක්ෂණයටයි.
   (2) ජලය, පරිසරය හා සංස්කෘතික වටිනාකම් සංරක්ෂණයටයි.
   (3) පස, ජෛව විවිධත්වය හා පරිසර සංරක්ෂණයටයි.
   (4) ජෛව බලය, ශාක විවිධත්වය හා සත්ත්ව විවිධත්වය සංරක්ෂණයටයි.
   (5) ජලය, පස හා ජෛව විවිධත්වය සංරක්ෂණයටයි.

30. සමස්ත ව්‍යාපාර සැලැස්ම පිළිබඳ කියවන්නාට අවබෝධයක් ලබා දෙන කියවන්නා ආකර්ෂණය කරන ව්‍යාපාර සැලැස්මේ උප කොටසකි,
   (1) විධායක සාරාංශය (2) මානව සම්පත් සැලැස්ම (3) ව්‍යාපාර විස්තරය
   (4) මූල්‍ය සැලැස්ම (5) අලෙවි සැලැස්ම

31. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වනුයේ,
   (1) පිටිකිරි නිෂ්පාදනයේ දී බාහිරින් කැල්සියම් එකතු කිරීම ආහාර සරු කිරීමකි.
   (2) ආහාර ප්‍රබල කිරීමේ දී සිදුවන්නේ ඉවත්වන පෝෂකය නැවත ස්ථාපනය කිරීමයි.
   (3) මේද සහිත කිරිපිටිවලට විටමින් A එකතු කිරීම ආහාර ප්‍රබල කිරීමකි.
   (4) පාන්පිටිවලට ෆෙරස් සල්ෆේට් එකතු කිරීම ආහාර ප්‍රබල කිරීමකි.
   (5) ආහාර සරු කිරීමේදී යම් පෝෂකයක් හෝ කිහිපයක් ආහාරයට එකතු කර ආහාරයේ පෝෂ්‍ය ගුණය වැඩි කිරීම සිදු කරයි.

32. මෙම රූපයේ දැක්වෙන ජලය එසවීමේ උපකරණය නම් කළ හැකි වනුයේ,
   (1) යොත්ත ලෙසය
   (2) ආඩියා ළිඳ ලෙසය
   (3) පර්සියානු රෝදය ලෙසය
   (4) නෝරියාව ලෙසය
   (5) පැද්දෙන ගොමුව ලෙසය

22 A/L අපි [papers group]

33. බීජෞෂකයක බිත්තර රක්කවීම හා පැටවුන් ඉපදීම එකම කොටසේ සිදුවන විට එය තුළ පවත්වා ගත යුතු ප්‍රශස්ත උෂ්ණත්වය වනුයේ,
   (1) 36.7°C (98°F) ය. (2) 32.7°C (99°F) ය. (3) 37.8°C (100°F) ය.
   (4) 38.3°C (101°F) ය. (5) 38.9°C (102°F) ය.

34. බීජ සුප්තතාව වැඩි කරන්නා වූ ශාක හෝර්මෝනය වන්නේ,
   (1) ඔක්සීන්ය (2) ඇබ්සිසික් අම්ලයයි (3) එතිලීන්ය
   (4) ගිබෙරලීන්ය (5) සයිටොකයිනීන්ය

35. ස්ට්‍රෝබෙරි ප්‍රචාරණය වනුයේ,
   (1) බල්බ මගිනි (2) රෛසෝම මගිනි (3) කෝම මගිනි
   (4) ධාවක මගිනි (5) මොරෙයියන් මගිනි

Ananda College Maths Section Exam Management Unit

36. ජාන විකිරණ තාක්ෂණය මගින් විසඳුම් නොලැබෙන කෘෂිකර්මාන්තයේ දක්නට ලැබෙන අභියෝගයක් වනුයේ,
(1) බෝගවලට කෘමි පළිබෝධ මගින් අධික බලපෑම් ඇතිවීම.
(2) වල්නාශක හේතුවෙන් බෝග ශාක මිය යාම.
(3) තුහින මගින් බෝගවලට හානි වීම.
(4) වෛරස හේතුවෙන් බෝග මිය යාම
(5) කාබනික එළවලු සඳහා පාරිභෝගික රුචිකත්වය

37. ආරක්ෂිත ශාකයක වහලයේ යට පෘෂ්ඨය මත සංතෘප්ත වී නිපදවන ජල බිංදු රත් වී බෝග ශාක මතට වැටී පිළිස්සීම සිදුවිය හැකිය. මේ සඳහා හේතු වනුයේ ආරක්ෂිත ගෘහය තුළ
(1) අධික ආර්ද්‍රතාවක් පැවතීමයි.
(2) ගෘහය තුළ සුළං වේගය වැඩි වීමයි.
(3) උත්ස්වේදන සීඝ්‍රතාවය වැඩි වීමයි.
(4) අඩු ආලෝක තීව්‍රතාවයක් පැවතීමයි.
(5) වායු සංසරණය නිසි ලෙස සිදු නොවීමයි.

38. කිසියම් පාරිභෝගික භාණ්ඩයක් සඳහා වන වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් වක්‍ර පහත සඳහන් සමීකරණවලින් නිරූපණය කෙරේ.

ඉල්ලුම $Q_D = 80 - 2P$ සැපයුම $Q_S = -20 + 3P$

එවිට වෙළඳපොළේ සමතුලිත ප්‍රමාණය සහ මිල වනුයේ,
(1) ඒකක 40 සහ රුපියල් 20 කි.
(2) ඒකක 56 සහ රුපියල් 12 කි.
(3) ඒකක 50 සහ රුපියල් 15 කි.
(4) ඒකක 60 සහ රුපියල් 10 කි.
(5) ඒකක 40 සහ රුපියල් 120 කි.

39. නැම්බියෙකු ගැබ් ගැන්වීම සඳහා යොදා ගැනීමට සුදුසු වනුයේ,
(1) යෞවනෝද්භාවයට පත් වී පරිණත දේහ බරෙන් $^2/_3$ ක බරකට වර්ධනය වූ පසුවයි.
(2) නැම්බියගේ දේහ බර පරිණත දේහ බරෙන් 50% ක බරකට වර්ධනය වූ පසුවයි.
(3) යෞවනෝද්භාවයට පත් වී දෙවනවරට මද ලක්ෂණ පෙන් වූ විටය.
(4) නැම්බිය පළමුවරට මද ලක්ෂණ පෙන්වන අවස්ථාවේදී ය.
(5) නැම්බියගේ වයස මාස 12-14 පමණ වූ පසුවය.

40. පසු අස්වනු හානියට බලපාන කායික විද්‍යාත්මක සාධකයකි.
(1) වායුගෝලීය සංයුතිය (2) සාපේක්ෂ ආර්ද්‍රතාවය (3) උෂ්ණත්වය
(4) කෘමි පළිබෝධ (5) එතිලීන් නිෂ්පාදනය

41. පසෙහි කැටායන හුවමාරු ධාරිතාව ඉහළ නැංවීමට දායක වන පාංශු සංඝටක වනුයේ,
(1) වැලි හා මැටිය (2) රොන්මඩ හා හියුමස්ය (3) මැටි හා හියුමස්ය
(4) රොන්මඩ හා සියුම් වැලිය (5) රොන්මඩ හා මැටිය

42. සත්ත්ව ආහාර සලාක පිළියෙල කිරීමේ දී ප්‍රෝටීන් ලබාදීම සඳහා යොදාගතහැකි ආහාර සංඝටකයකි.
(1) මත්ස්‍ය අක්මා තෙල් (2) සහල් නිවුඩු (3) පොල් පුන්නක්කු
(4) සිප්පිකටු (5) පරිප්පු කුඩු

43. අතින් ඉදිරීමෙන් හා උදළු ගෑම මගින් පාලනය කිරීමට අපහසු වල්පැළෑටි සඳහා උදාහරණ වනුයේ පිළිවෙළින්,
(1) නිදිකුම්බා හා කලාඳුරු ය.
(2) මොණරකුඩුම්බිය හා දියසියඹලා ය.
(3) ඇටෝර හා කුප්පමේනියා ය.
(4) නිදිකුම්බා හා මොණරකුඩුම්බිය ය.
(5) කලාඳුරු හා පිටවක්කා ය.

44. තෘණ කපා වියලා සත්ත්ව ආහාරයක් ලෙස සංරක්ෂණය කරගත් විට එය හඳුන්වන්නේ,
(1) හේ ලෙසය (2) ගෝචර තෘණ ලෙසය (3) සයිලේජ් ලෙසය
(4) තෘණ අන්නය ලෙසය (5) පෝෂ තෘණ ලෙසය

Ananda College Maths Section Exam Management Unit
22 A/L අපි [papers group]

45. ඉවැසි හරිතාගාර ආවරණය හේතුවෙන් ගෝලීය උණුසුම ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා කෘෂිකර්ම ක්ෂේත්‍රයෙන් ලබාදිය හැකි දායකත්වය වනුයේ,
   (1) කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය අවම කර වැඩි වශයෙන් හේන් ගොවිතැන් කිරීමයි.
   (2) කැළෑ එළිකර නව වන වගා බිම් ඇති කිරීමයි.
   (3) වගා කළ හැකි සෑම බිමකම බෝග වගා කිරීමයි.
   (4) නව වන වගා හා කෘෂි වන වගා ඇති කිරීමයි.
   (5) පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය ප්‍රචලිත කිරීමයි.

46. විවිධ සාධකවල බලපෑම නිසා මාතෘ පාෂාණය ජීර්ණය වී මාතෘ ද්‍රව්‍ය සෑදෙයි. පාංශු පැතිකඩක මාතෘ ද්‍රව්‍ය අඩංගු වනුයේ,
   (1) *O* කලාපයේය. (2) *B* කලාපයේය. (3) *C* කලාපයේය.
   (4) *R* කලාපයේය. (5) *A* කලාපයේය.

47. පුද්ගලයකුගේ ආදායම ඉහළ යනවිට පිටිකිරි සඳහා ඔහුගේ ඉල්ලුම වැඩි වේ නම් පිටිකිරි උදාහරණයක් ලෙස ගත හැකි වනුයේ,
   (1) නොමිල භාණ්ඩයකටය. (2) ගිෆන් භාණ්ඩයකටය.
   (3) බාල භාණ්ඩයකටය. (4) ශුභ සාධන භාණ්ඩයකටය.
   (5) සාමාන්‍ය භාණ්ඩයකටය.

48. රූප සටහනේ දක්වෙන්නේ රෝග ත්‍රිකෝණයකි. මෙහි A අක්ෂරය මගින් පෙන්නුම් කරන සාධකය වනුයේ,
   (1) ධාරකයා ය. (2) වාහකයා ය.
   (3) කාලය ය. (4) උෂ්ණත්වය ය.
   (5) බෝගය ය.

49. ගවයින්ගේ කෘත්‍රිම සිංචනය පිළිබඳව ප්‍රකාශ තුනක් පහත දක්වේ.
   A. කෘත්‍රිම සිංචනය මගින් වැඩිපුර පිරිමි සතුන් බිහිවේ.
   B. මෙමගින් ලිංගාශ්‍රිත රෝග බෝවීමේ අවධානම අඩුය.
   C. හොඳ ලක්ෂණ සහිත ආබාධිත සතෙකු වුවද අභිජනනය සඳහා යොදාගත හැකිය.

   ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වනුයේ,
   (1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය.
   (4) B පමණි. (5) A, B හා C සියල්ලම ය.

50. බෝග ශාකයක අභ්‍යන්තරයෙහි ජීවත්වන කෘමි පළිබෝධයෙකු විනාශ කිරීමට යෙදිය යුතු වන්නේ,
   (1) ස්පර්ශ කෘමිනාශකයකි. (2) සංස්ථානික කෘමිනාශකයකි.
   (3) කැට ආකාර කෘමිනාශකයකි. (4) කාබමේට කෘමිනාශකයකි.
   (5) ස්වාසරෝධක කෘමිනාශකයකි.

ඎඎඎ

Ananda College Maths Section Exam Management Unit
22 A/L අපි [papers group]

22 A/L අපි
papers group

සියලු ම හිමිකම් ඇවිරිණි.

ආනන්ද විද්‍යාලය, කොළඹ 10 Ananda College, Colombo 10 Ananda College, Colombo 10 Ananda College, Colombo 10 Ananda College, Colombo 10 Ananda College, Colombo 10

ආනන්ද විද්‍යාලය - කොළඹ 10

08	S	II

අවසාන වාර පරීක්ෂණය - 2022 ඔක්තෝම්බර්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

කෘෂි විද්‍යාව II

Agricultural Science II

13 ශ්‍රේණිය

පැය තුනයි

Three hours

නම :..

උපදෙස් :

වැදගත් :

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 ක් සහිතව **A** සහ **B** යන කොටස් දෙකකින් යුක්ත වේ.
- **A කොටස - ව්‍යුහගත රචනා (පිටු 02 - 11)**

  සියලුම ප්‍රශ්නවලට පිළිතුරු, මෙම පත්‍රයේ ම සපයන්න.

  ඔබේ පිළිතුරු ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.
- **B කොටස - රචනා (පිටුව 12)**

  ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A** සහ **B** කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ **A** කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

  ප්‍රශ්න පත්‍රයේ **B** කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.
- **A** සහ **B** කොටස් දෙකට ම නියමිත කාලය පැය තුනකි.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

(08) කෘෂි විද්‍යාව **II**

කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
	8	
	9	
	10	
එකතුව		
ප්‍රතිශතය		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

සංකේත අංක

උත්තර පත්‍ර පරීක්ෂක		
පරීක්ෂා කළේ:	1	
	2	
අධීක්ෂණය		

Ananda College Maths Section Exam Management Unit

22 A/L අපි [papers group]

"A" කොටස - ව්‍යුහගත රචනා

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි.)

01. (A) කෘෂිකර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ප්‍රධාන ස්ථානයක් දරන අතර රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට ප්‍රධාන වශයෙන් දායක වේ.

(i) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග හතරක් සඳහන් කරන්න.

....

....

....

....

(ii) කෘෂිකර්මාන්තයට අයත් ප්‍රධාන ක්ෂේත්‍ර හතර නම් කරන්න.

22 A/L අපි [papers group]

....

....

....

(iii) ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සාර්ථකත්වය සඳහා කෘෂි ව්‍යාප්ති සේවය යොදාගත හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.

....

....

(B) කෘෂිකාර්මික පසක ගොවි බෝග වගාවක් සාර්ථකව පවත්වාගෙන යාමට පාංශු ජල ප්‍රමාණය වැදගත් වේ.

(i) බෝග ක්ෂේත්‍ර පසක ප්‍රධාන තෙතමන මට්ටම් තුන සඳහන් කරන්න.

....

....

....

(ii) ලවණතාව සහිත පසක පාංශු තෙතමනය මැනීමට සුදුසු ක්‍රමයක් නම් කරන්න.

....

(iii) ක්ෂේත්‍රයෙන් ලබාගත් පස් සාම්පලයක ක්ෂේත්‍ර ධාරිතාවයේ දී බර අනුව තෙතමන ප්‍රතිශතය 25 % කි. මෙම පසෙහි ස්ථිර මැලවීමේ අංකයේ දී තෙතමන ප්‍රතිශතය 12 % ක් නම් පසේ ඇති ශාකයට ලබාගත හැකි ජල ප්‍රමාණය ගණනය කරන්න.

....

....

....

....

(iv) පසෙන් ශාකයට ලබාගත හැකි ජල ප්‍රමාණයෙන් 50 % ක් අඩු වූ විට බෝග ශාකවල නැවත ජලය සම්පාදනය කළ යුතු නම් නැවත ජලය යෙදීමේ දී පාංශු ජල ප්‍රමාණය ගණනය කරන්න.

....

....

....

Ananda College Maths Section Exam Management Unit

(C) ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප වර්ගීකරණයට අනුව WL_{1b} කලාපයට අයත් ඉඩමක ව්‍යාපාරිකයෙක් විසිතුරු පැළෑටි වගා කිරීමට අදහස් කරයි.

(i) ව්‍යාපාරිකයාගේ ඉඩම අයත් වන කෘෂි දේශගුණික කලාපය නම් කරන්න.

....

(ii) එම ඉඩම අයත් කලාපයේ ප්‍රධාන පස් කාණ්ඩය නම් කරන්න.

....

(iii) ප්‍රදේශයට බලපාන අධික වර්ෂාපතනය වගාවට අහිතකර ලෙස බලපාන ආකාර දෙකක් සඳහන් කරන්න.

....

....

(iv) අධික වර්ෂාපතනයේ අහිතකර බලපෑම අවම කිරීමට ව්‍යාපාරිකයාට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

....

(D) ජලය එසවීමට යොදා ගනු ලබන ජල පොම්ප ආකාරයෙන් පහත රූපසටහනේ දැක්වේ.

22 A/L අපි [papers group]

Ananda College Maths Section Exam Management Unit

(i) පොම්පයේ A හා B වල කාර්යයන් නම් කරන්න.

....

....

(ii) ඉහත ආකාරයේ පොම්පවල සූර්ණය (Priming) සිදුකරන ආකාරය සඳහන් කරන්න.

....

....

(iii) මෙම පොම්පය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා මූලධර්මය සඳහන් කරන්න.

....

....

....

(E) තත්පරයට ලීටර් 10 ක් ජලය පිටවන නල ළිඳක් භාවිතයෙන් මීටර් 60 ක් දිග හා මීටර් 9 ක් පළලින් යුතු වගා ක්ෂේත්‍රයකට 6 cm උසට ජලය සම්පාදනය කිරීමට අවශ්‍යව ඇත.

(i) සම්පාදනය කළ යුතු ශුද්ධ ජල පරිමාව ගණනය කරන්න.

....

....

....

....

(ii) ජල සම්පාදන පද්ධතියේ ජලයේ ගෙනයාමේ කාර්යක්ෂමතාව 60 % ක් නම් නළ ළිඳෙන් ජලය නිකුත් කළ යුතු පරිමාව ගණනය කරන්න.

....

....

....

....

(iii) ක්ෂේත්‍රයට අවශ්‍ය ජල පරිමාව නළ ළිඳෙන් ලබාදීමට ගතවන කාලය පැයවලින් ගණනය කර පෙන්වන්න.

....

....

....

....

22 A/L අපි [papers group]

Ananda College Maths Section Exam Management Unit

(F) සංරක්ෂණ ගොවිතැනේ දී පස සංරක්ෂණය කිරීමේ උපක්‍රමයක් ලෙස අධික බෑවුම් සහිත භූමිවල වගා කිරීමේ දී අවම බිම් සැකසීමේ ක්‍රම භාවිතා කරයි.

(i) අවම බිම් සැකසීමේ ක්‍රමයේ දී බිම් සැකසීම අවම කරගන්නා ආකාර දෙකක් නම් කරන්න.

....

....

(ii) අවම බිම් සැකසීමේ අවාසි දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) මෙම භූමියේ පාංශු ඛාදනය වැළැක්වීම සඳහා යෙදිය හැකි ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රම දෙකක් සඳහන් කරන්න.

....

....

02. (A) (i) මෙම රූපයේ දක්වා ඇති බද්ධ ක්‍රමය නම් කරන්න.

....

(ii) ඉහත (A) (i) හි සඳහන් කළ බද්ධ ක්‍රමය යොදාගන්නා බෝගයක් නම් කරන්න.

....

(iii) සාර්ථක බද්ධ කිරීමක් සඳහා වන මූලික අවශ්‍යතා තුනක් සඳහන් කරන්න.

....

....

....

(iv) ඒක බීජ පත්‍රී ශාක බද්ධ නොකිරීමට හේතුව සඳහන් කරන්න.

(B) ගුණාත්මක බිත්තර වී භාවිතය නිසා වී වගාවේ නිරෝගී හා ඒකාකාර වගාවක් මෙන්ම වැඩි අස්වැන්නක් ද ලබාගත හැකිය.

(i) බිත්තර වී සඳහා බීජ සහතික කිරීමේ සේවයේ පර්යේෂණාගාර ප්‍රමිති දෙකක් සඳහන් කරන්න.

(ii) පර්යේෂණාගාරයේ දී බීජවල ජීව්‍යතාවය සහ දිරිය මැනීම සඳහා සුලබව භාවිතා කරන පරීක්ෂණය නම් කරන්න.

(iii) ධාන්‍ය බීජ ගබඩාවල පවත්වාගත යුතු තත්ත්ව දෙකක් සඳහන් කරන්න.

(iv) ගබඩා කරන ලද ඇතැම් බීජවල ප්‍රරෝහණ ප්‍රතිශතය කාලය සමඟ වැඩි වී පසුව ක්‍රමයෙන් අඩු වී යයි. මේ සඳහා බලපාන හේතුවක් සඳහන් කරන්න.

22 A/L අපි [papers group]

Ananda College Maths Section Exam Management Unit

(C) බෝග නිෂ්පාදන ඉලක්ක වෙත ළඟාවීමේ දී ශාක තුළ ප්‍රවේණික විචලනයක් ඇති කිරීම මඟින් ප්‍රභේදන ඇති කිරීම ශාක අභිජනනයේ මූලික පදනමයි.

(i) ප්‍රවේණික ප්‍රතිරෝධී ප්‍රභේද නිපදවීමේ දී බෝග වනජ දර්ග යොදා ගැනීම බහුලව සිදුකරයි. බෝග වනජ දර්ග සතුව පවතින සුවිශේෂී ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(ii) ප්‍රවේණික විචලතාව ඇති කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

(iii) DNA ප්‍රතිසංයෝජන තාක්ෂණයේ දී ජාන පිටපත් සංඛ්‍යාව වැඩි කරගැනීමට යොදා ගන්නා ක්‍රමය නම් කරන්න.

(D) දේශගුණික හා පාරිසරික සාධකවලට මුහුණදිය හැකි තාක්ෂණයක් ලෙස ආරක්ෂිත ගෘහ තුළ බෝග වගාව හැඳින්විය හැකිය.

(i) පූර්ණ ආරක්ෂිත ගෘහ සඳහා පොලිතීන් තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු අත්‍යවශ්‍යම කරුණු දෙකක් සඳහන් කරන්න.

(ii) ආරක්ෂිත ගෘහ තුළ වගා කළ හැකි පළතුරු බෝග දෙකක් නම් කරන්න.

....

....

(iii) පූර්ණ ආරක්ෂිත ගෘහ තුළ සනීපාරක්ෂාව ඇති කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයන් හතරක් නම් කරන්න.

....

....

....

....

(E) රෝගාබාධවලින් තොර නිරෝගී ශාක සමූහයක් ලබාගැනීමට තවානක් අතිශයින්ම වැදගත් වේ.

(i) තවාන් පාත්තියක දිග තීරණය කරන සාධක දෙකක් නම් කරන්න.

....

....

(ii) බෝගයක ආයු කාලය මාස තුනක් වන බෝගයක් තවානේ තැබිය යුතු කාලය ගණනය කරන්න.

....

....

....

(iii) තවාන් දමා පැළ සිටුවන ක්ෂේත්‍ර බෝග වර්ග දෙකක් නම් කරන්න.

....

....

(F) (i) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මාළුමිරිස් වගාවක් සඳහා පහත දැක්වෙන අවස්ථා යටතේ යොදාගත හැකි වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රමයක් සඳහන් කරන්න.

(a) පෘෂ්ඨීය ජල සම්පාදනය : ....

(b) උපපෘෂ්ඨීය ජල සම්පාදනය : ....

(ii) ජල වහනය දුර්වල පසක වැඩෙන ශාකයක දැකිය හැකි ලක්ෂණ හතරක් නම් කරන්න.

....

....

....

....

(iii) දුර්වල ජලවහනය නිවැරදි කිරීමට යොදන උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

....

....

22 A/L අපි [papers group]
Ananda College Maths Society Exam Management Unit

(G) උඩරට ගෙවතු වගාව ශ්‍රී ලංකාවේ මහනුවර ප්‍රදේශයේ සුලබව හමුවන බහු ස්තරීය බෝග වගා පද්ධතියකි.

(i) ස්වභාවික සම්පත් භාවිතය සම්බන්ධව මෙම වගා පද්ධතියේ ඇති වාසි හතරක් නම් කරන්න.

....

....

....

....

(ii) උඩරට ගෙවතු වගාවේ ඇති එක් අවාසියක් නම් කරන්න.

....

03. (A) දෛනික ආහාර වේල් සැලසුම් කිරීමේ දී ආහාර කාණ්ඩ අනුව විවිධ ආහාර පරිභෝජනය කළ යුතු ප්‍රමාණ පිළිබඳ ආහාර පිරමීඩය මඟ පෙන්වයි.

(i) ආහාර පිරමීඩයේ පාදස්ථය මගින් නිරූපණය වන සමබල ආහාරයකට අවශ්‍ය වන පෝෂක සංඝටකය නම් කරන්න.

....

(ii) පාසල් ළමුන්ට සමබල ආහාර වේලක් ලබාදීමේ වාසි දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (Body Mass Index - BMI) ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලබන සමීකරණය නිවැරදිව ලියා දක්වන්න.

....

....

(B) ආහාර නරක් වීමට අභ්‍යන්තර මෙන්ම බාහිර සාධක ද බලපායි.

(i) ආහාර නරක් වීමට බලපාන අභ්‍යන්තර සාධක දෙකක් නම් කරන්න.

....

....

(ii) ආහාර ද්‍රව්‍ය නරක් වීමේ දී එහි වෙනස් විය හැකි ඉන්ද්‍රිය ගෝචර නොවන පරාමිතියක් නම් කරන්න.

....

(iii) නරක් වූ ආහාර අනුභවය නිසා ඇති විය හැකි ගැටලු දෙකක් සඳහන් කරන්න.

....

....

(C) අතිරික්ත කෘෂි නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා ඒවා පරිරක්ෂණය කරනු ලැබේ.

(i) වැඩි උෂ්ණත්වයක් භාවිතා කරන කිරි පරිරක්ෂණ ක්‍රම දෙකක් නම් කරන්න.

....

....

(ii) ආහාර පැසවීමේ ප්‍රධාන ආකාර තුන සඳහන් කරන්න.

....

....

....

(iii) සකසන ලද ආහාර සඳහා ප්‍රතිඔක්සිකාරක එකතු කිරීමේ වාසියක් සඳහන් කරන්න.

....

22 A/L අපි [papers group]
Ananda College Maths Section Exam Management Unit

(D) ගොවිපොළ සතුන්ට පෝෂණය සැපයීමට සත්ත්ව ආහාර සපයනු ලැබේ.

(i) පහත දක්වා ඇති සත්ත්ව ආහාරවල නිර්දේශිත දළ ප්‍රෝටීන මට්ටම සඳහන් කරන්න.

ආහාරය	දළ ප්‍රෝටීන මට්ටම
(a) බ්‍රොයිලර් ආරම්භක සලාකය	....
(b) කුකුළු පැටවුන්ගේ ආහාර සලාකය	....
(c) වැඩෙන කිකිළියන්ගේ ආහාර සලාකය	....

(ii) ශ්‍රී ලංකාවේ සත්ත්ව ආහාරවල ආහාර ආකලන ලෙස බහුලව යොදාගන්නා ද්‍රව්‍යයන් දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) පහත දැක්වෙන එක් එක් සත්ත්ව ආහාර කාණ්ඩ සඳහා උදාහරණයක් බැගින් නම් කරන්න.

(a) ශාකමය ප්‍රෝටීන පරිපූරක ....

(b) මේද පරිපූරක ....

(E) දිනක් වයසැති කුකුළු පැටවුන් නිපදවීම සඳහා බිත්තර රක්වනයක් තුළ කුකුළු බිත්තර 20000 ක් තැන්පත් කරන ලදී. බිජෞෂණය ආරම්භ කර පළමු සතිය අවසානයේ දී කැන්ඩ්ලින් පරීක්ෂාව සිදුකළ විට පැහැදිලි බිත්තර 4000 ක් හඳුනාගන්නා ලදී. බීජෞෂණ කාලය අවසානයේ දී කුකුළු පැටවුන් 16000 ක් ලැබුණි.

(i) සඵල බිත්තරවල ප්‍රතිශතය (Fertilily %) ගණනය කරන්න.

....

....

....

(ii) සඵල බිත්තරවල රක්කවීමේ ප්‍රතිශතය ගණනය කරන්න.

....

....

....

(iii) කිකිළි බිත්තර රක්කවීමේ ප්‍රතිශතයට බලපාන සාධක හතරක් සඳහන් කරන්න.

....

....

....

....

(iv) ඉතා විශාල බිත්තර රක්කවීම සඳහා යොදා නොගැනීමට හේතුව සඳහන් කරන්න.

....

(F) ගව පාලනයේ දී මනා කළමනාකරණ ක්‍රමවේද අනුගමනය කිරීමෙන් වැඩි ආර්ථික ලාභ ලබාගත හැකිය.

(i) ගව පාලනයේ දී කෘත්‍රිම සිංචනය යනු කුමක් ද ?

....

....

....

22 A/L අපි [papers group]
Ananda College Maths Section-Exam Management Unit

(ii) ගව අභිජනනයේ දී කෘත්‍රිම සිංචනයේ ප්‍රධාන වාසි හතරක් සඳහන් කරන්න.

....

....

....

....

(iii) ගවයින්ගේ ශුක්‍ර තනුක කිරීම සඳහා යොදාගන්නා තනුක කාරක දෙකක් සඳහන් කරන්න.

....

....

(iv) ශුක්‍ර ඇගයීමට සිදු කරනු ලබන පරීක්ෂණ දෙකක් නම් කරන්න.

....

....

(G) (i) ගවයාගේ ආහාර මාර්ග පද්ධතියේ පහත සඳහන් කොටස්වල ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

කොටස	ප්‍රධාන කාර්යය
(a) මුඛය	....
(b) රූමනය	....
(c) ජඨරාශය	....
(d) මහා අන්ත්‍රය	....

(ii) පහත සඳහන් සංඝටක ගවයාගේ ආහාර මාර්ග පද්ධතියේ දී අවශෝෂණය කෙරෙන ප්‍රධාන ස්ථානය සඳහන් කරන්න.

(a) වාෂ්පශීලී මේද අම්ල ....

(b) ඇමයිනෝ අම්ල ....

(c) ග්ලූකෝස් ....

04. (A) නැප්සැක් දියර ඉසින යන්ත්‍රයක රූපසටහනක් පහත දැක්වේ.

Ananda College Maths Section Exam Management Unit
22 A/L අපි [papers group]

(i) ඉසින යන්ත්‍රයේ පහත කොටස්වල ක්‍රියාකාරීත්වය සඳහන් කරන්න.

කොටස		ක්‍රියාකාරීත්වය
1.	A	....
2.	B	....
3.	C	....

(ii) ඉහත උපකරණය භාවිතා කිරීමේ දී ක්‍රියාකරවන්නා විසින් පිළිපැදිය යුතු ආරක්ෂක ක්‍රියාමාර්ග තුනක් සඳහන් කරන්න.

....

....

....

(iii) වගාවේ කෘමි පළිබෝධයෙකු පාලනය සඳහා කෘමිනාශකයෙක් මිලිලීටර් 200 ක් හෙක්ටරයක යොදන ලෙස කෘමිනාශක ඇසුරුමේ ලේබලයෙහි සඳහන් කර ඇත. ගොවි මහතා මේ සඳහා හෙක්ටායරයකට ලීටර් 10 ක් යෙදීමට ක්‍රමාංකනය කර ඇති ලීටර 16 ක ධාරිතාවයක් සහිත ඉසින යන්ත්‍රයක් භාවිතා කරයි. ඔහු විසින් ඉසින යන්ත්‍රයේ ටැංකියට යෙදිය යුතු පළිබෝධනාශක ප්‍රමාණය ගණනය කරන්න.

....

....

(B) පහත දී ඇති රූපසටහනින් දැක්වෙන්නේ ශාකවල රෝග හටගැනීමේ දී දැකිය හැකි චක්‍රීය ස්වභාවයකි.



(i) මෙහි A හා B යනුවෙන් දක්වා ඇත්තේ කුමන සාධක දැයි සඳහන් කරන්න.

A - ....

B - ....

(ii) ශාක රෝග ඇති කරන අජීවී සාධක දෙකක් සඳහන් කරන්න.

....

....

22 A/L අභි [papers group]
Ananda College Maths Section Exam Management unit

(C) අර්තාපල් ශාකවල පෙන්නුම් කරන රෝග ලක්ෂණ කිහිපයක් පහත දී ඇත. දී ඇති ලක්ෂණ පදනම් කරගෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- පත්‍ර මත කහ පැහැ පැල්ලම් ඇති වීම
- පැළ කුරු වීම
- පත්‍ර මත තෙත් වූ කුඩා ලප ඇති වීම
- අල දුර්වර්ණ වූ දුඹුරු පැහැ ගැනීම

(i) ඉහත ලක්ෂණ අතුරින් ශාකයට වැළදී ඇති රෝගය පශ්චිම අංගමාරය බවට තීරණය කිරීමට උපකාරී වන රෝග ලක්ෂණ දෙක නම් කරන්න.

....

....

(ii) ශාකයට පත්‍ර විචිත්‍ර රෝගය වැළදී ඇති බව තීරණය කිරීමට උපකාරී වන රෝග ලක්ෂණ දෙක සඳහන් කරන්න.

....

(D) ලොකු ඒළුණු වෙළෙඳපොළේ පවත්නා ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පහත සමීකරණයෙන් දැක්වේ.

$$Qd = 450 - 10\,P \qquad Qs\,,\ - 90 + 5\,P$$

මෙහි P යන්නෙන් කිලෝග්‍රෑමයක මිල රුපියල් වලින් ද Q යන්නෙන් ඒකක ප්‍රමාණය මෙට්‍රික් ටොන්වලින් අදහස් කෙරේ.

(i) වෙළෙඳපොළේ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න.

සමතුලිත මිල ....

....

සමතුලිත ප්‍රමාණය ....

....

(ii) ගොවීන්ට සහනයක් සැපයීමේ අරමුණින් රජය විසින් ලොකු ළූණු කිලෝග්‍රෑමයකට රුපියල් 40 ක සහතික මිලක් ලබාදුන්නේ නම් ගොවීන් විසින් වෙළෙඳපොළට සපයනු ලබන ලොකු ළූණු ප්‍රමාණය (මෙට්‍රික්ටොන්) සඳහන් කරන්න.

....

....

....

(iii) ලොකු ළූණු සඳහා ආදේශක නිෂ්පාදනයක් නම් කරන්න.

....

(E) ශාක වර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය ශාක පෝෂක ලෙස හඳුන්වයි.

(i) ශාක තුළ නයිට්‍රජන්වල කායික විද්‍යාත්මක කාර්යභාර දෙකක් සඳහන් කරන්න.

....

....

(ii) ශාකවල පොස්පරස් ඌනතා ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) පසෙහි pH අගය අඩු වන විට නයිට්‍රජන් හා පොස්පරස් සුලබතාව අඩු වීමට හේතුව සඳහන් කරන්න.

....

(F) (i) ශාක හෝර්මෝන නිර්වචනය කරන්න.

....

....

....

....

(ii) කෘත්‍රිම ඔක්සින වාණිජව භාවිතා කරන අවස්ථා දෙකක් සඳහන් කරන්න.

....

....

(G) බෝගයක වර්ධනය තක්සේරු කිරීමට පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය යොදා ගත හැකිය.

(i) පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය (Leaf Area Index / LAI) යන්න අර්ථ දක්වන්න.

....

(ii) පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

....

....

(iii) තක්කාලි ශාකයක පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය මැනීමට භාවිතා කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න.

....

....

❖❖❖

22 A/L අපි [papers group]
Ananda College Maths Section Exam Management Unit

සියලු ම හිමිකම් ඇවිරිණි.

ආනන්ද විද්‍යාලය, කොළඹ 10 Ananda College, Colombo 10

ආනන්ද විද්‍යාලය කොළඹ 10

08	S	II

අවසාන වාර පරීක්ෂණය - 2022 ඔක්තෝම්බර්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022

කෘෂි විද්‍යාව II

Agricultural Science II

13 ශ්‍රේණිය

* ප්‍රශ්න 04 කට පමණක් පිළිතුරු සපයන්න.

* අවශ්‍ය තැන්හී නම් කරන ලද පැහැදිලි රූපසටහනක් දෙන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150 කි.)

B කොටස - රචනා

05. (i) කෘෂිකර්මාන්තයේ දී පරාගකාරක ආරක්ෂා කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(ii) කෘමි පළිබෝධ පාලනය කිරීම සඳහා රසායනික කෘමිනාශක භාවිතා කිරීම නිසා පරිසරයට සිදුවිය හැකි පරිසර ගැටලු විස්තර කරන්න.

(iii) ජාන සම්පත් සංරක්ෂණයේ වැදගත්කම විස්තර කරන්න.

06. (i) රෝමාන්තිකයන්ගේ ආමාශයේ විවිධ කොටස්වල කාර්යයන් විස්තර කරන්න.

(ii) පැහැදිලිව නම් කරන ලද රූපසටහනක් උපයෝගී කරගනිමින් ද්‍රර්ශීය පාංශු පැතිකඩක් විස්තර කරන්න.

(iii) එළවළු නිෂ්පාදනයේ දී පසු අස්වනු හානි අවම කරගත හැකි ආකාරය විස්තර කරන්න.

07. (i) කෘෂිකාර්මික භූමිවල පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමේ ක්‍රම විස්තර කරන්න.

(ii) බෝග ශාකවල උත්ස්වේදන පාලනය කිරීමට යොදාගත හැකි උපක්‍රම පැහැදිලි කරන්න.

(iii) වල් පැළෑටි කළමනාකරණයේ දී යොදාගන්නා භෞතික හා යාන්ත්‍රික ක්‍රම විස්තර කරන්න.

08. (i) වගා බිම්වල ජලවහනය කිරීමේ වැදගත්කම විස්තර කරන්න.

(ii) පටක රෝපණ විද්‍යාගාරය තිබිය යුතු මූලික හා අත්‍යවශ්‍ය අවශ්‍යතා විස්තර කරන්න.

(iii) උඩරට ගෙවතු වගාවේ ව්‍යුහය විස්තර කර එහි වාසි අවාසි පැහැදිලි කරන්න.

09. (i) බිම් සැකසීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාවට නැංවීමේ දී සිදුකෙරෙන ක්‍රියාකාරකම් විස්තර කරන්න.

(iii) අඩු උෂ්ණත්ව තත්ත්ව යටතේ ආහාර පරිරක්ෂණය කරන ක්‍රම විස්තර කරන්න.

10. (i) ආරක්ෂිත ශාක ගෘහයක් තුළ සුදුසු පාරිසරික තත්ත්ව පවත්වා ගැනීමේ වැදගත්කම විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ බහුකාර්ය සංවර්ධන ව්‍යාපාරවල කාර්යභාරය පැහැදිලි කරන්න.

(iii) වෙළෙඳපොළ ව්‍යුහයන් හතර නම් කර එක් එක් වෙළෙඳපොළ ව්‍යුහවල කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න.

❖❖❖

Ananda College Maths Section Exam Management Unit

22 A/L අපි [papers group]

22 A/L අපි
papers group

LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440